මොරවැව ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මොරවැව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය මූල්‍ය ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 සිට 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ලද පරිත්‍යාග මුදල් රු.179,330 ක් ගිණුම්ගත කර නොතිබුණි.	අවසන් ගිණුම් සකස් කිරීමේදී පරිත්‍යාග ලැබීම් ඇතුළත් කිරීමට අතපසු වී ඇති අතර ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පරිත්‍යාග විධිමත්ව භාරගෙන ඒවා සටහන් තබා ගිණුම් ගත කළ යුතුය.
(ආ)	ප්‍රවර්ථන වර්ෂයේදී ප්‍රාදේශිය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළව නිම්වැඩ වටිනාකම රු.27,303,708 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	එම	ප්‍රාග්ධන වැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ප්‍රාදේශිය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් රු.22,273,540 ක් ණයගැති හා ණයහිමි ලෙස දක්වා නොතිබුණි.	එම	එම

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය, ප්‍රවර්ථන වර්ෂයේ ආරම්භක ශේෂයන් වශයෙන් ගිණුම්වලට ගැනීමේදී රු.14,000,000 ක නොසැසඳීමක් පැවතුණි.	උපලේඛනයේ සඳහන් මුදල රු.65,305,881ක් ලෙස නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නොසැසඳීම් නිවැරදි කිරීමට පියවර ගෙන ගිණුම් ගැලපිය යුතුය.

1.6.3 අවිනිශ්චිත ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2011 වර්ෂයේ සිට පැවත එන රු.7,864,759 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු නොකර ශේෂ පත්‍රයේ සමුච්චිත අරමුදල හා සංචිත යටතේ දක්වා තිබුණි.	2011 අවසන් ගිණුමේ මෙම ශේෂය මුලින්ම සටහන් වන අතර එතැන් පටන් මේ දක්වා සෑම අවසන් ගිණුමකම සටහන් වී ඇත. ඊට අදාළ තොරතුරු නොමැති වීම නිසා මෙය නිරවුල් කිරීමට නොහැකි වී ඇත. කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව.	අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.133,366,378 ක් වූ ගිණුම් විෂයන් 04 ක් සඳහා ඉඩම් බලපත්‍ර ඔප්පු, මිනින්දෝරු සැලසුම්, ස්ථාවර වත්කම් ලේඛන, තොග ආගනන වාර්තා ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	ඇතැම් වත්කම් වල මූලික පිරිවැය හෝ මුල් වටිනාකම පැහැදිලිව හඳුනාගත හැකි තොරතුරු නොමැති බැවින් මෙම තත්ත්වය ඇතිවී තිබේ. මේ වන විට තොරතුරු එක් රැස් කරමින් පවතින අතර කඩිනමින් අදාල ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.	ගිණුම් ශේෂයන් තහවුරු කරගත හැකි නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව		අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත				
	(i)	වගන්තිය 24	සභාව සතු මාර්ග සියල්ල හඳුනාගෙන ඉන්වෙන්ට්‍රිගත කිරීමට හා ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කර නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ඇති අතර අලුතින් සංවර්ධනය කරන ලද මාර්ග විස්තර යාවත්කාලීන කර නොමැත. ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් ගැසට් කිරීමට සැලසුම් කර ඇති බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii)	වගන්තිය 134	සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට	දියුණු කළ ප්‍රදේශ 3 ක් හඳුනාගෙන ඇත. ඒවා ගැසට් කර වරිපණම්	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

		හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු කර නොතිබුණි.	අයකිරීමට සැලසුම් කර ඇති බව.	
	(iii) වගන්තිය 159	සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.3,297,883 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ ආදායම් වලින් කොටසක් මේ වන විටත් අයකර ගෙන ඇත. ඉතිරි කොටස අයකරගැනීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින අතර නීතිමය පියවර ගැනීමටද කටයුතු කර ඇති බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	(i) මුදල් රෙගුලාසි 139(8)	අවස්ථා දෙකකදී සිදු කරන ලද රු.635,160 ක් වටිනා මිලදී ගැනීම් තොග පොතෙහි ඇතුළත් කර නොතිබුණි.	විෂයය නිලධාරීන්ගේ අතපසුවීමකින් එසේ සිදුවී ඇත. මින් ඉදිරියට එසේ නොවීමට වග බලා ගන්නා බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
	(ii) මුදල් 1645 රෙගුලාසි	සෑම මසක් අවසන් වී ඊළඟ මස 15 දිනට පෙර දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඉදිරිපත් කළ යුතු නමුත් සභාව සතු වාහන 12 න් 05 ක් සඳහා පමණක් මුල් හය මාසය සඳහා ධාවන සටහන් ඉදිරිපත් කර තිබුණි.	එම	මුදල් රෙගුලාසි ප්‍රකාරව සභාව සතු සියළුම වාහන වල ධාවන සටහන් ඉදිරිපත් කළ යුතුය.
	(iii) මුදල් 1646 රෙගුලාසි	සභාව විසින් වාහන සම්බන්ධයෙන් සිදු කරන ලද රු.282,103 ක් වටිනා අළුත්වැඩියා කිරීම්, සේවා කිරීම්, අමතරකොටස් මිලදී ගැනීම් ලොග් සටහන් පත්‍රයේ ඇතුළත් කර නොතිබුණි.	එම	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය	ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී ඒවා නිසි පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ජාතික විගණන පනත අනුව කටයුතු කළ යුතුය.

(ඇ)	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 02/2018 චක්‍රලේඛය	චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද ප්‍රවර්ථන වර්ෂය සඳහා කාර්යසාධන ගිවිසුම්වලට එළඹ නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම්වලට එළඹී ඇත. මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැත. ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව.	චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 චක්‍රලේඛය 3.1 ඡේදය	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු වාහන 10ක් සම්බන්ධයෙන් ඉන්දන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි .	ඉදිරි වර්ෂය තුළ සියලුම වාහනවල ඉන්ධන පරීක්ෂාකිරීම් සිදුකිරීමට කටයුතු කරන බව	චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	අධිකරණ අමත්‍යාංශයේ ලේකම්ගේ අංක 04/1994 හා 1994 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය	සෑම මාණ්ඩලික නිලධාරියෙකු විසින් වාර්ෂිකව තම වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	නියමිත දිනට පෙර වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව	චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ 31 .පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු2,820,596 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.176,105 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
---------	----------------	--------	---------	----------	-------------	---------	---------	-----------
කුලී	6,400	5,532	5,329	698	6,200	3,862	3,836	495
බලපත්‍ර ගාස්තු	375	174	174	-	425	243	244	-
වෙනත් ආදායම් (ජල)	3,100	1,796	1,796	364	-	1,366	1,002	364
එකතුව	**9,875**	**7,502**	**7,299**	**1,062**	**6,625**	**5,471**	**5,082**	**859**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟව පැවැති වාහන කුලී රු.416,240 ක් වූ අතර එයින් රු.188,730 ක් වසර ගණනාවක සිට පැවත එන හිඟයක් බව නිරීක්ෂණය විය.	හිඟ කුළී ආදායම් වලින් කොටසක් මේ වන විටත් අයකර ගෙන ඇත. ඉතිරි කොටස අයකරගැනීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින බව	විධිමත් පරිදි හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාරණා 28 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ අතර පළාත් සභාව විසින් හඳුන්වාදුන් අතුරු ව්‍යවස්ථා 05 ක් පමණක් අනුමත කරගෙන තිබුණි.	අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කිහිපයක් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කරමින් තිබෙන බව.	ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාවක කාර්යයන් අතර ප්‍රධාන කාර්යයක් ලෙසට බල ප්‍රදේශය තුළ සිදු කරන ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කිරීම සිදුකළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.	ආදායම් පරීක්ෂක නිලධාරියෙකු නොමැති නිසා ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කිරීම අපහසු වී ඇති බවත් සංවර්ධන නිලධාරියා මඟින් අදාළ කටයුතු සිදුකර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු සිදුකර ඇති බව.	ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේශීය ණය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ණය මුදල නිසි පරිදි ගෙවීම් නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන	2024 නොවැම්බර් සිට හිඟ ණය වාරික ගෙවිය යුතු කාලය නැවත සංශෝධනය කර දෙන ලදි. ඒ අනුව 2024 නොවැම්බර් සිට	මනා මූල්‍ය කළමනාකරණයක් පවත්වාගත යුතුය.

වර්ෂය වන විටද රු.3,125,000 ක කල්ඉකුත් වූ ණය ශේෂයක් ගෙවීමට තිබුණි.	මාසිකව ණය වාරික ගෙවමින් සිටින බව.	
(ආ) 2017 වර්ෂයේදී රු.1,826,485 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබූ අතර එම අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.	අදාල අත්තිකාරම් සභාව යටතේ පවතින ප්‍රජා මණ්ඩල වෙත කොන්ත්‍රාත් අත්තිකාරම් ලෙස ගෙවා ඇත. එම කොන්ත්‍රාත්වල අවසන් බිල්පත් සඳහා ගෙවීම් කරන විට අදාල අත්තිකාරම් මුදල් අය කරගෙන ඇතත් ඒවා අවසන් ගිණුම්වලින් ගලපා නොමැති නිසා මෙම මුදල නොපියවූ අත්තිකාරම් ලෙස පෙන්නුම් කරන බව.	අත්තිකාරම් සම්බන්ධයෙන් මනා පාලනයක් පවත්වා ගත යුතුය.

3.4 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.16,695,000 ක් පිරිවැය වූ JCB යන්ත්‍රය දැනට වසර 05 ක පමණ කාලයක සිට අක්‍රියව පැවතුණි.	අදාල රථය අලුත්වැඩියා කිරීම සඳහා විශාල මුදලක් වැය වන නිසාත් සභාව සතුව එවැනි විශාල මුදලක් නොමැති නිසාත් මෙම තත්ත්වය ඇති බව.	වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය.
(ආ) අංක 02/2017 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ ව්‍යාපෘති මඟින් ලැබුණ වාහන 02 ක් හා ටේලර් 02 ක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	සභාව සතු වාහන වලින් වාහන 02 ක් පමණක් මෙතෙක් සභාවට පවරාගෙන නොමැති අතර අනෙක් සියලුම වාහන සභාව වෙත පවරාගෙන ඇති බව.	වත්කම් සභාව නමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ) 2021 වර්ෂයේදී තුළදී රු.485,500 ක් වැයකර මිලදී ගෙන තිබුණු කොම්පෝස්ට් අමුද්‍රව්‍ය ඇඹරුම් යන්ත්‍රය අමුද්‍රව්‍ය හිඟකම නිසාවෙන් අක්‍රීයව පවතී. මෙම යන්ත්‍රය මිලදී ගැනීමට පෙර සත්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් මෙම යන්ත්‍රය නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය කෙරේ.	සභාවේ අවශ්‍යතාවය නොතකා එවක පැවති රජයේ අවශ්‍යතා මත කොම්පෝස්ට් අඹරුම් යන්ත්‍රය මිලදී ගත් හෙයින් යන්ත්‍රයට අවශ්‍ය ප්‍රමාණවත් අමුද්‍රව්‍ය නොමැතිකම නිසා යන්ත්‍රය අක්‍රමිකව පවතින බව.	වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය.

3.5 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 වර්ෂයේදී සිදුකරන ලද ව්‍යාපෘති දෙකකට අදාළව අය කළ යුතු රු.435,625 ක ප්‍රමාද ගාස්තු මේ වන තෙක් අයකර නොතිබුණි.	මෙම සිද්ධි වසර ගණනාවකට පෙර වූ සිදුවීමක් වන අතර එවකට සේවය කරන ලද නිලධාරීන් මේ වන විට කාර්යාලයේ නොමැත. එබැවින් අදාල කාලසීමාවේ සිටි තාක්‍ෂණ නිලධාරිගෙන් මේ පිළිබඳව විමසා බැලූ අතර අදාළ ව්‍යාපෘති භාර ඉංජිනේරුවරයා නිර්දේශ කරන ලද ප්‍රමාණය සඳහා පමණක් ප්‍රමාද ගාස්තු අයකළ බවත් ඉංජිනේරුවරයාගේ නිර්දේශය සඳහන් වන කිසිඳු සටහනක් හෝ ලිපියක් ලිපිගොනුවල නොමැත. එහෙයින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීම ප්‍රායෝගික ගැටළු වී ඇති බව.	ගෙවීම් හා අයකර ගැනීම් විධිමත්ව සිදුකළ යුතුය.

3.6 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා අනපනතේ 19(XII) වගන්තියට අනුව සභාවට අයත් ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ එක් කොටසක් වසර 03 කට අධික දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීමේදී පළාත් පාලන කරුණුවලට වගකීම දරණ විෂය භාර ඇමතිතුමාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුව තිබුණි. නමුත් වසර 20 කට අදාළ දීර්ඝ කාලීන බදු ගිවිසුම් මත අදාළ විෂයභාර ඇමතිතුමාගේ පූර්ව අනුමැතියකින් තොරව සභා ගොඩනැගිල්ලේ වහලයේ සෝලා පවර් සිස්ටම් ස්ථාපනය කිරීම සඳහා සිනෝ ලංකා පවර් ජෙනරල් පෞද්ගලික සමාගමට ලබා දී තිබුණි.	අදාල සමාගම සමඟ සෝලා පවර් සිස්ටම් ස්ථාපනය කිරීම සම්බන්ධව වසර 20 ක කාලයක් සඳහා ගිවිසුම් ගතවීමට ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබාදී ඇති බව දන්වමින් ගිවිසුම් අත්සන් කරන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලිඛිතව උපදෙස් ලබා දී ඇති අතර එම උපදෙස් අනුව කටයුතු කර ඇති බව.	ආදායම් උපයාගත හැකි ආකාරයට ගිවිසුම් සංශෝධනය කර නීති උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත සේවක මණ්ඩලය හා තථ්‍ය සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 06 ක පුරප්පාඩු 09 ක් පවතින බව අනාවරණය වූ අතර තනතුරු 02 ක අනුමත	අදාල පුරප්පාඩු පුරවාගැනීමේ දැඩි අවශ්‍යතාවයක් තිබුනද නව පත්වීම් ලබා නොදීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණය මත බඳවාගැනීම් අත්හිටුවා	අවශ්‍යතාවයේ වැදගත්කම පෙන්වා දෙමින් පුරප්පාඩු පියවීමට කටයුතු කළ යුතුය.

	සංඛ්‍යාව ඉක්මවා අතිරික්ත සේවකයන් 03 ක් පැවතුණි.	ඇති බැවින් එම පුරප්පාඩු පුරවාගැනීමට නොහැකි වී ඇති බව.	
(ආ)	නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ PT/03/2021 ට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 11 දෙනෙකු විසින් ප්‍රමාණවත් පරිදි ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.	මෙම වසර තුළදී අදාල නිලධාරීන් සියලුදෙනාම ලවා ඇප තැන්පත් කරවීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	වසර ගණනාවකට පෙර නිලධාරීන් 05 දෙනෙකුට ලබාදී තිබූ එකතුව රු.335,396 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ණයගැතියන් පිළිබඳව තොරතුරු රැස්කරමින් පවතී. කඩිනමින් හිඟ ණය මුදල් අයකරගැනීමට කටයුතු කරන බව	රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ලේඛනය මත පදනම්ව ක්‍රියාකාරකම්වල නිරතව තිබුණි.	ඉදිරි වර්ෂවල සිට ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු සිදු කරන බව.	වාර්ෂිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කර තිබුණද එම අංශය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම පමණක් සිදු කරන නමුත් විධිමත් විගණන වැඩසටහනකට අනුව ක්‍රියාත්මක කරන බව නිරීක්ෂණය නොවීය. තවද අභ්‍යන්තර විගණන සැලැස්ම ජාතික විගණන කාර්යාලයට ඉදිරිපත් කර අනුමත කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.	මේ වන විට නිවැරදිව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරමින් පවතින බව.	නිරීක්ෂණයේ දක්වා ඇති කරුණු නිවැරදි කර අභ්‍යන්තර විගණනය විධිමත් කළ යුතුය.

4.3 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් ක 05 9 සියයට සිට සියයට දක්වාද වියදම් 74 සිට සියයට 02 ක සියයට 04 විෂයන් 25 ක් දක්වාද විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.	සැලසුම් කළ පරිදි ආදායම් නොලැබීම් නිසාවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබේ. ආදායම් අඩුවීම නිසාවෙන් වියදම් සීමාකිරීමට සිදු වී ඇති බව	අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය.

4.4 තිරසර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක හඳුනා ගැනීම පිළිබඳ නිසි අවබෝධයක් සමාලෝචිත වර්ෂය තුළදීද ලබාගෙන නොතිබූ නමුත් තිරසර සංවර්ධන ඉලක්ක දෙකක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.	තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සහ අදාල නිර්ණායක හඳුනාගැනීම පිළිබඳව නිසි අවබෝධයක් නිලධාරීන් තුළ නොමැති නිසාවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබෙන බව	තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක අත්පත් කර ගත යුතුය.